සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

116204

| 62 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

**පුරවැසි අධ්‍යාපනය I, II**
குடியியற் கல்வி I, II
Civic Education I, II

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## පුරවැසි අධ්‍යාපනය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමට ලබාගන්නා භාණ්ඩවලට මිලක් ගෙවීමට සිදුවේ නම්, එය හඳුන්වන්නේ,
(1) භෞතික භාණ්ඩ යනුවෙනි. (2) නිෂ්පාදන භාණ්ඩ යනුවෙනි.
(3) ප්‍රාග්ධන භාණ්ඩ යනුවෙනි. (4) ආර්ථික භාණ්ඩ යනුවෙනි.

**2.** ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක අතුරින් කුඩා ම භූමි ප්‍රමාණයක් හිමි දිස්ත්‍රික්කය වන්නේ,
(1) කොළඹ ය. (2) මාතර ය. (3) මොනරාගල ය. (4) වන්නි ය.

**3.** අධිකරණ රීති සංශෝධනය කිරීමේ හා වෙනස් කිරීමේ බලය සතු වන්නේ,
(1) අධිකරණ ඇමතිවරයාට ය. (2) අග්‍ර විනිශ්චයකාරවරයාට ය.
(3) අධිකරණ සේවා කොමිෂන් සභාවට ය. (4) නීතිපතිවරයාට ය.

**4.** ග්‍රීක පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වන්නේ,
(1) මන්ත්‍රණ සභාවයි. (2) මහජන සභාවයි.
(3) පුරවැසි සභාවයි. (4) සෙනෙට් සභාවයි.

**5.** ගැටුම් නිරාකරණයේ දී මැදිහත්කරුවකු සතු විය යුතු වැදගත් ම ගුණාංගය වන්නේ,
(1) කාරුණික වීමයි. (2) අපක්ෂපාතී බවයි.
(3) ඉවසීමයි. (4) ධාර්මික බවයි.

**6.** මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරගැනීම කෙරෙහි බලපෑ ආසන්නත ම හේතුව වූයේ,
(1) ඇමරිකන් නිදහස් සටනයි. (2) ප්‍රංශ විප්ලවයයි.
(3) පළමු ලෝක යුද්ධයයි. (4) දෙවන ලෝක යුද්ධයයි.

**7.** පාරිසරික ගැටලු ඇති වීමට බලපා ඇති හේතු අතරින් වඩාත් ප්‍රබල ම හේතුව කුමක් ද?
(1) ජන සංඛ්‍යාවේ වැඩි වීමයි (2) ආර්ථික කටයුතු පුළුල් වීමයි
(3) සම්පත් අධිභාවිතයයි (4) ගෝලීය උණුසුම් වීමයි

**8.** අධිකරණ සේවා කොමිසමේ සභාපති ධූරය හිමි වන්නේ,
(1) අග්‍ර විනිශ්චයකාරවරයාට ය. (2) නීතිපතිවරයාට ය.
(3) අධිකරණ ඇමතිවරයාට ය. (4) ජනාධිපතිවරයාට ය.

[දෙවැනි පිටුව බලන්න.

**9.** අවශ්‍යතා හා වුවමනා ඉටුවන ආකාරයට ස්වභාව ධර්මයෙන් ලැබෙන සම්පත්වල ස්වභාවය වෙනස් කිරීම
(1) පාරිභෝජනයයි. (2) නිෂ්පාදනයයි. (3) ප්‍රවාහනයයි. (4) උපයෝජනයයි.

**10.** කලාපීය සාමූහික සුරක්ෂිතතාව වෙනුවෙන් පළමුව ගොඩනගා ගන්නා ලද යුධමය සංවිධානය කුමක් ද?
(1) ආසියාන් සංවිධානය (2) එක්සත් ජාතීන්ගේ සංවිධානය
(3) සාර්ක් සංවිධානය (4) නේටෝ සංවිධානය

**11.** නීතියෙහි දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයකි,
(1) මිනිසාගේ හැඟීම් හා සම්බන්ධ වීම.
(2) නීති කඩකිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වීම.
(3) නීතිය අවශ්‍ය පරිදි අර්ථකථනය කළ හැකි වීම.
(4) නීතිය නිශ්චිත නොවීම හා අපැහැදිලි වීම.

**12.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නිල කාලය අවුරුදු
(1) තුනකි. (2) හතරකි. (3) පහකි. (4) හයකි.

**13.** ඒකීය ආණ්ඩුක්‍රමයක් පවතින රාජ්‍යයක් වන්නේ මින් කුමක් ද?
(1) ශ්‍රී ලංකාව (2) ඇමරිකා එක්සත් ජනපදය
(3) ස්විට්සර්ලන්තය (4) ඕස්ට්‍රේලියාව

**14.** මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් ඉතා පහසුවෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකි වන්නේ,
(1) ශ්‍රේෂ්ඨාධිකරණයට ය. (2) මානව හිමිකම් කොමිසමට ය.
(3) නීතිපති දෙපාර්තමේන්තුවට ය. (4) පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට ය.

**15.** නූතන බහු සංස්කෘතික සමාජවල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,
(1) ආගමික මතවාද අතර ගැටුම් නිර්මාණය වීමයි.
(2) ගෝලීයකරණයේ බලපෑමට ලක්වීමයි.
(3) ජාතීන් අතර ගැටුම් නිර්මාණය වීමයි.
(4) සංස්කෘතික සම්මිශ්‍රණය වේගවත් වීමයි.

**16.** භෞතික ජීවන තත්ත්ව දර්ශකය ගණනය කිරීම සඳහා භාවිත කරන සංරචක නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) සාක්ෂරතාව, උපතේ දී ආයු අපේක්ෂාව, ළදරු මරණ අනුපාතය
(2) ක්‍රය ශක්තිය, විදේශීය ශුද්ධ සාධක ආදායම, සාක්ෂරතාව
(3) ආයු අපේක්ෂාව, දළ ජාතික නිෂ්පාදිතය, සුභසාධක වියදම්
(4) ළදරු මරණ අනුපාතය, සාක්ෂරතාව, ඒක පුද්ගල ආදායම

**17.** වර්තමාන කොවිඩ් 19 වසංගත තත්ත්වයත් සමග ශ්‍රී ලංකා ආර්ථිකයට සෘජු බලපෑමක් සිදු වූ ක්ෂේත්‍රය වන්නේ,
(1) අධ්‍යාපන සේවා දුර්වල වීමයි. (2) ප්‍රවාහන සේවා දුර්වල වීමයි.
(3) සංචාරක කර්මාන්තය බිඳ වැටීමයි. (4) කෘෂි කර්මාන්තය අඩපණ වීමයි.

**18.** ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජික රටවල් නිවැරදි ව ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) චීනය, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය, රුසියාව, බ්‍රිතාන්‍යය
(2) චීනය, ප්‍රංශය, රුසියාව, බ්‍රිතාන්‍යය, ඇමරිකා එක්සත් ජනපදය
(3) ඉන්දියාව, ප්‍රංශය, රුසියාව, බ්‍රිතාන්‍යය, ඇමරිකා එක්සත් ජනපදය
(4) ජර්මනිය, රුසියාව, බ්‍රිතාන්‍යය, ඇමරිකා එක්සත් ජනපදය, ස්වීඩනය

**19.** සාර්ක් සංවිධානයේ රටවල් අතර නිදහස් වෙළඳ කලාපයක් ඇති කිරීමේ අරමුණින් අත්සන් කරන ලද ගිවිසුම කුමක් ද?
(1) සප්තා (SAPTA) (2) නේටෝ (NATO)
(3) වෝර්සෝ (WORSO) (4) සෆ්තා (SAFTA)

**20.** සුරා බදු පනත හා සම්බන්ධ වැරදි සඳහා නඩු පැවරිය යුත්තේ කුමන උසාවියක ද?
(1) අභියාචනාධිකරණයක (2) මහාධිකරණයක
(3) මහේස්ත්‍රාත් අධිකරණයක (4) දිසා අධිකරණයක

**21.** ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන්නේ මින් කුමක් ද?
(1) නීති සම්පාදනය කිරීම (2) යුක්තිය පසිඳලීම
(3) නීති ක්‍රියාත්මක කිරීම (4) නීති විවරණය කිරීම

[තුන්වැනි පිටුව බලන්න.

**22.** රටක් තුළ ජීවත්වන විවිධ සංස්කෘතීන්ට අයත් පිරිස් එක් ජාතියක් ලෙස සැලකෙන රාජ්‍ය සංකල්පය වන්නේ,
(1) ජාතික රාජ්‍යයයි. (2) ඒකීය රාජ්‍යයයි.
(3) සන්ධීය රාජ්‍යයයි. (4) බහුවිධ රාජ්‍යයයි.

**23.** ඒක පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටක් වන්නේ මින් කුමක් ද?
(1) ඉන්දියාව (2) ස්වීඩනය (3) චීනය (4) ප්‍රංශය

**24.** ස්වභාවික හේතූන් මත ජල දූෂණය වන අවස්ථා පමණක් නිවැරදි ව දක්වා ඇත්තේ කුමන පිළිතුරේ ද?
(1) ගිණිකඳු, භූමිකම්පා, කසල බැහැර කිරීම (2) ගිණිකඳු, භූමිකම්පා, සුනාමි
(3) භූමිකම්පා, සුනාමි, මැණික් ගැරීම (4) භූමිකම්පා, සුනාමි, කෘත්‍රිම ජලාශ ඉදිකිරීම

**25.** ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජීවත්වන පුරවැසියකු විසින් ඉටු කළ යුතු සදාචාරාත්මක යුතුකමක් වන්නේ,
(1) රජයට නියමිත බදු ගෙවීමයි. (2) පවතින නීතියට ගරු කිරීමයි.
(3) අධිකරණයට ගරු කිරීමයි. (4) සමාජ සිරිත් විරිත් පිළිපැදීමයි.

**26.** තිරසාර සංවර්ධන ක්‍රියාවලියේ දී අවධානය යොමු විය යුතු වැදගත් ම කාරණයක් වන්නේ,
(1) පරිසර හිතකාමී ලෙස තීරණ ගැනීමයි. (2) පරිසර සම්පත් ආයෝජන දිරි ගැන්වීමයි.
(3) පරිසර නීති රීති සංශෝධනය කිරීමයි. (4) පරිසර ද්‍රව්‍ය වෙනුවට විකල්ප ද්‍රව්‍ය හඳුන්වා දීමයි.

**27.** ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිදු වූයේ කුමන වර්ෂයේ ද?
(1) 1931 (2) 1947 (3) 1972 (4) 1978

**28.** ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක ජනමාධ්‍ය විසින් ඉටු කළ යුතු කාර්යයක් **නොවන්නේ**,
(1) දේශපාලන පක්ෂ ප්‍රවර්ධනය කිරීමයි. (2) ජනතාවගේ දැනුම වර්ධනය කිරීමයි.
(3) සත්‍ය හා නිවැරදි තොරතුරු ලබාදීමයි. (4) කාලීන තොරතුරු නිසි වේලාවට ලබාදීමයි.

**29.** කිසියම් රටක ආණ්ඩුව සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය රාජ්‍යයක් වෙත ලබාදීම
(1) බලය විමධ්‍යගත කිරීමයි. (2) බලය බෙදා හැරීමයි.
(3) බලය සංවිධානය කිරීමයි. (4) බලය ව්‍යාප්ත කිරීමයි.

**30.** පළාත් සභාවක ආණ්ඩුකාරවරයා ඉවත් කිරීමේ බලය සතු වන්නේ,
(1) ප්‍රධාන අමාත්‍යවරයාට ය. (2) අගමැතිවරයාට ය.
(3) ජනාධිපතිවරයාට ය. (4) අග විනිසුරුවරයාට ය.

**31.** ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්ය ඇතුළත් තේමා දෙකක් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) පොදු මංමාවත් - නාගරික පාසල් (2) පොදු මංමාවත් - ජල සම්පාදනය
(3) පොදු මංමාවත් - මහජන පොළ (4) පොදු මංමාවත් - මහජන සෞඛ්‍යය

**32.** රුසියාව හා යුක්රේනය අතර නිර්මාණය වී ඇත්තේ,
(1) දේශපාලන ගැටුමකි. (2) වාර්ගික ගැටුමකි.
(3) ආගමික ගැටුමකි. (4) ආර්ථික ගැටුමකි.

**33.** ස්වභාවික පරිසර තුලනයට දැඩි බලපෑම් එල්ල වන සාධකයක් වන්නේ,
(1) ගෝලීය උෂ්ණත්වය වැඩි වීමයි. (2) මානව ක්‍රියා හේතුවෙන් පරිසරය වෙනස් වීමයි.
(3) දේශගුණික විපර්යාස ඇති වීමයි. (4) ස්වභාවික ආපදාවන් වැඩි වීමයි.

**34.** ගැටුම් නිරාකරණයේ දී 'ජය-ජය' විසඳුම් ලබාගැනීම සඳහා වඩාත් යෝග්‍ය ක්‍රමය කුමක් ද?
(1) විනිසීම (2) සමථකරණය (3) සාකච්ඡා කිරීම (4) මැදිහත්කරණය

**35.** රැකියාවක නියුක්තවීමේ දී ඔබගෙන් ඉටු විය යුතු වැදගත් ම යුතුකම වන්නේ,
(1) ශ්‍රම අභිමානයෙන් යුතුව කාර්යක්ෂමව සේවය සැපයීමයි.
(2) තම අධ්‍යාපන සුදුසුකම් රැකියාවට අනුව සම්පූර්ණ කිරීමයි.
(3) රටේ අවශ්‍යතා අනුව තම කුසලතා වර්ධනය කරගැනීමයි.
(4) වෘත්තීය අයිතීන් වෙනුවෙන් සැමවිටම පෙනී සිටීමයි.

[හතරවැනි පිටුව බලන්න.

116204

**36.** මූලික අයිතිවාසිකම් සංකල්පය පැහැදිලි කෙරෙන ප්‍රකාශය වන්නේ,
(1) ළමා අයිතිවාසිකම්වලට අනුකූල අයිතිවාසිකම් ය.
(2) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ අයිතිවාසිකම් ය.
(3) වෛකල්පිත සම්මුතිවලට අයත් අයිතිවාසිකම් ය.
(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති අයිතිවාසිකම් ය.

**37.** ජාත්‍යන්තර අධිකරණයේ මූලස්ථානය පිහිටා ඇති රට කුමක් ද?
(1) ඇමරිකා එක්සත් ජනපදය (2) ස්වීඩනය
(3) නෙදර්ලන්තය (4) ඩෙන්මාර්කය

**38.** දේපල පාලනය සම්පූර්ණයෙන් ම පුරුෂයා සතුවන නීතිය ඇතුළත් වන්නේ පහත කුමන කාණ්ඩයට ද?
(1) මුස්ලිම් නීතියට (2) සිවිල් නීතියට
(3) උඩරට නීතියට (4) තේසවලාමෙයි නීතියට

**39.** **'අ'** තීරුවේ බහු සංස්කෘතික ජන සමාජයක දක්නට ලැබෙන ආගම් ද **'ආ'** තීරුවේ එම ආගම්වලට අදාළ ආගමික උත්සව ද දැක්වේ. **'අ'** තීරය හා **'ආ'** තීරය නිවැරදිව ගැලපූ විට පිළිතුර තෝරන්න.

| 'අ' | | 'ආ' | |
|---|---|---|---|
| 1. | බෞද්ධ | A - | ශිව රාත්‍රිය |
| 2. | හින්දු | B - | රාමසාන් |
| 3. | ඉස්ලාම් | C - | මහ සිකුරාදා |
| 4. | ක්‍රිස්තියානි | D - | වෙසක් |

(1) ABDC (2) BCAD (3) DABC (4) DCBA

**40.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් ධනවාදී අර්ථ ක්‍රමය පිළිබඳ කියවෙන ප්‍රකාශ ඇතුළත් පිළිතුර තෝරන්න.
A - සමාජ අවශ්‍යතා ඉටුකර ගැනීමට භාණ්ඩ හා සේවා යොදාගනියි.
B - නිෂ්පාදන භාණ්ඩ මිල ක්‍රමයට අනුව වෙළඳපොළට නිකුත් කරයි.
C - ආර්ථිකය සතු සම්පත්වල අයිතිය පෞද්ගලික අංශය සතු වේ.
D - භාණ්ඩ හුවමාරුව දේශීය මෙන් ම විදේශීය වෙළෙඳපොළට ද ව්‍යාප්ත වී ඇත.
E - ලාභ ලැබීමේ පරමාර්ථයෙන් ආර්ථික කටයුතු මෙහෙයවනු ලබයි.
(1) ABC (2) ADE (3) BCE (4) CDE

**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021 (2022)

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

## පුරවැසි අධ්‍යාපනය II

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** (i) ශ්‍රී ලංකාවේ ඡන්දදායකයන්ට ඡන්දය භාවිත කිරීමට අවස්ථාව සැලසෙන මැතිවරණ **දෙකක්** නම් කරන්න.

(ii) මධ්‍යම ආණ්ඩුව සතු බලතල ප්‍රාදේශීය පාලන ආයතනවලට පැවරීමේ දී අනුගමනය කරන ක්‍රම **දෙක** මොනවා ද?

(iii) ශ්‍රී ලංකාවට අතීතයේ දී වෙළඳාම සඳහා පැමිණි විදේශීය ජාතීන් **දෙකක්** නම් කරන්න.

(iv) නිෂ්පාදන සාධක **දෙකක්** හා ඒ සඳහා කරන ගෙවීම් **දෙක** නම් කරන්න.

(v) මානව සමාජය තුළ දක්නට ලැබෙන ගැටුම් වර්ග කළ හැකි ප්‍රධාන ක්ෂේත්‍ර **දෙක** කුමක් ද?

(vi) නීතියේ ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

(vii) ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවට නියෝජිතයන් තෝරාගන්නා ප්‍රධාන ක්‍රම **දෙක** නම් කරන්න.

(viii) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී අවධානයට යොමු වී ඇති ප්‍රධාන අංග **දෙකක්** නම් කරන්න.

(ix) සංවර්ධනය වන රටවල් මුහුණපාන ප්‍රධාන ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

(x) එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ප්‍රධාන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 × 10 = 20 යි)

**2.** ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය සඳහා නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම අත්‍යවශ්‍ය සාධකයක් වේ.

(i) ප්‍රජාතන්ත්‍රවාදය යන සංකල්පය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ii) නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වය සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටු විය යුතු කාර්යයන් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් **එක්** කාර්යයක් ඉටු කළ යුතු ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

**3.** ගැටුම් ඇතිවීමට තිබෙන අවස්ථා අවම කරගැනීම ගැටුම් වළක්වා ගැනීමට හේතු වේ.

(i) සූක්ෂ්ම ගැටුම්වලට නිදසුන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) බේරුම්කරුවකු සතු විය යුතු ගුණාංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) විනිසීමේ ක්‍රියාවලියේ දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් **එක්** ලක්ෂණයක් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

[හයවැනි පිටුව බලන්න.

**4.** ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් තුළ යුක්තිය හා නීතිය ආරක්ෂා කරදීම අධිකරණය සතු විශේෂ වගකීමක් වේ.

(i) නීතිපතිතුමාගේ කාර්යයන් හා බලතල ක්‍රියාත්මක කිරීමට සහාය වන නිලධාරීන් **දෙදෙනෙක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) අපරාධ නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වැරදි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(*b*) ඔබ සඳහන් කළ වැරදි වළක්වාලීම සඳහා පුරවැසියකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

**5.** පරිසර හිතකාමී තිරසර සංවර්ධනයක් රටකට අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වී ඇත.

(i) සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන නූතන මිනුම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ වර්තමාන සංවර්ධන අභියෝග ජයගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** යෝජනා කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) තිරසර සංවර්ධනය සඳහා ගමන් කිරීමේ දී පුරවැසියකු විසින් ඉටු කළ යුතු පුරවැසි යුතුකම් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් **එක්** යුතුකමක් ඉටු කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

**6.** අර්ථ ක්‍රමයක් යනු මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගැනීම සඳහා යම් සමාජයක් සංවිධානය වී ඇති ආකාරය වේ.

(i) දැනට ලෝකයේ පවතින විවිධ අර්ථ ක්‍රම **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) ගෝලීයකරණය හා තාක්ෂණික දියුණුව නිසා ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන යහපත් ප්‍රතිඵල **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) වෙළඳපල අර්ථ ක්‍රමයක් තුළ දක්නට ලැබෙන අහිතකර ලක්ෂණ **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් **එක්** අහිතකර ලක්ෂණයක් අවම කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් යෝජනා කරන්න. (ලකුණු 02 යි)

**7.** ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට විවිධ ආගමික, සමාජයීය හා සංස්කෘතික සාධක බලපා ඇත.

(i) ශ්‍රී ලංකාවේ සිංහල ජාතියට අමතරව ජීවත්වන වෙනත් ජාතීන් වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) බහුසංස්කෘතික සමාජයක පුරවැසියකු වශයෙන් ජීවත්වන ඔබ සමාජයේ යහපැවැත්ම සඳහා ප්‍රගුණ කරගත යුතු ගුණාංග **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) බහුසංස්කෘතික සමාජයක එක්සත්ව ජීවත්වීමෙන් අත්වන ප්‍රතිඵල **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් **එක්** ප්‍රතිඵලයක් සමාජයේ යහපැවැත්මට හේතු වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

* * *

www.ehelpmate.com

Visit us to download
O/L & A/L Past Papers and Term Test Papers

පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර ලබා ගැනීම සඳහා
www.ehelpmate.com
වෙබ් අඩවියට පිවිසෙන්න.